**වහාම ප්‍රකාශයට පත්කිරීම පිණිසයි**

## ශ්‍රී ලංකාව : රඳවාගැනීම් සහ ආධාර බෙදාහැරීමට කෙරෙන සීමා පැණවීම් නතරකරනු

*යුද්ධයට මැදිවී සිටින සාමාන්‍ය දෙමළ ජනතාවට ආධාර නොලැබෙන අතර ඔවුන්ගේ ගමන් කිරීමේ නිදහසටද බාධා පැමිණ තිබේ*

(2008 දෙසැම්බර් 23 වැනිදා, නිව්යෝර්ක් නගරය) - ශ්‍රී ලංකා ආණ්ඩුව වන්නි පලාතේ සටන්වලින් පලා එන සාමාන්‍ය ජනතාව ඉවක් බවක් නොමැතිව රඳවා ගැනීම නතරකළයුතු බවත් ආධාර අවශ්‍යව සිටින ජනතාවට ආධාරකිරීම සඳහා මානුෂික ආධාර ආයතනවලට සටන් පවතින ප්‍රදේශවලට යාම සඳහා වහාම අවසර දිය යුතු බවත් හියුමන් රයිට්ස් වොච් සංවිධානය අද නිකුත්කල නව වාර්තාවක සඳහන් කරයි.

"වටකොට, උන්හිටිතැන් අහිමිව සහ රඳවාගෙන : ශ්‍රී ලංකාවේ වන්නි පලාතේ සාමාන්‍ය වැසියන්ගේ ඉරණම" මැයෙන් යුත් පිටු 49ක වාර්තාව වන්නි පලාතේ යුද්ධයට මැදිවී සිටින 230,000 සිට 300,000 දක්වාවූ සමාන්‍ය ජනතාව මුහුණපා සිටින ඉරණම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආණ්ඩුවේ වගකීම විස්තර කරයි. මානුෂික ආධාර ආයතනවලට ආණ්ඩුව විසින් පණවනු ලැබ තිබෙන බරපතල සීමාවන් හේතුවෙන් එම ජනතාව බරපතල ආහාර සහ අනෙක් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය හිඟයකට මුහුණ පා සිටී. දෙමළ විමුක්ති කොටි සංවිධානයේ (එල්ටීටීඊ) පාලනය පවතින ප්‍රදේශවලින් පලා ඒමට සමත්වූ පුද්ගලයන් සහ පවුල් හමුදාවේ පාලනය පවතින කඳවුරුවල සීමිත පහසුකම් යටතේ රඳවා තබා සිටී.

"එක්සත් ජාතීන්ගේ සහ අනෙක් ආධාර සේවකයන්ට පිටව යන මෙන් ආණ්ඩුව නියෝග කිරීම හේතුවෙන් ලක්ෂ සංඛ්‍යාත සාමාන්‍ය වැසියන් පිරිසක් සීමිත ආධාර සහිතව යුධ කලාපයේ සිරවී සිටින" බව හියුමන් රයිට්ස් වොච් සංවිධානයේ ආසියා කළාපය භාර අධ්‍යක්ෂවරයා වන බ්‍රැඩ් ඇඩම්ස් ප්‍රකාශ කරයි. "ගහෙන් වැටුනු මිනිසාට ගොනා ඇන්නා සේ යුද්ධයෙන් පලා ඒමට සමත්වූ ජනතාවට අවසානයේදී සිදුවන්නේ හමුදාවේ පාලනය යටතේ පවතින සිර කඳවුරුවල දින නියමයකින් තොරව සිරවී සිටීමටය."

2008 ඔක්තෝබර් මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා හියුමන් රයිට්ස් වොච් සංවිධානය විසින් ශ්‍රී ලංකාවේ උතුරු පලාතේදී සිදුකරන ලද පර්යේෂණ මත මෙම වාර්තාව පදනම්වී තිබේ. එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධ ආයතන සහ මානුෂික ආධාර ආයතනවල නිළධාරීන්, රාජ්‍යතාන්ත්‍රිකයන්, ආගමික නායකයන් සහ යුද්ධයට මැදිවී සිටින සාමාන්‍ය ජනතාව ඇතුලු පිරිසකගෙන් මේ සඳහා සවිස්තර සම්මුඛ සාකච්ඡා ලබාගන්නා ලදි. ආණ්ඩුව විසින් පණවා තිබෙන දැඩි සීමා හේතුවෙන් වන්නි පලාතේ ගැටුම් පවතින කලාපයට ඇතුලුවීමට ස්වාධීන නිරීක්ෂකයන්ට සහ ජනමාධ්‍යවේදීන්ට අවසර නැත.

"කොටුවීම සහ නොසලකා හැරීම : වන්නි පළාතේ සාමාන්‍ය ජනතාවට එරෙහිව කෙරෙන එල්ටීටීඊයේ අතවර" මැයෙන් තම පාලන ප්‍රදේශවල සිටින සාමාන්‍ය දෙමළ ජනතාවට එල්ටීටීඊය සලකන කෲර ස්වභාවය දක්වමින් දෙසැම්බර් 12 වෙනිදා හියුමන් රයිට්ස් වොච් සංවිධානය විසින් වාර්තාවක් නිකුත් කරන ලදි. (http://www.hrw.org/en/reports/2008/12/15/trapped-and-mistreated-0). තම පාලනය පවතින ප්‍රදේශවල සිටින ජනතාවට වන්නි පලාතේ යුධ ගැටුම් පවතින ප්‍රදේශයෙන් පලායාමට එල්ටීටීඊය අවසර නොදෙන ආකාරයත් සාමාන්‍ය ජනතාවගේ ජීවිත අනතුරේ හෙලමින් එල්ටීටීය ඔවුන් යුධ කලාපයේ බලහත්කාරයෙන් වැඩෙහි යොදවන ආකාරයත් එල්ටීටීය විසින් බලහත්කාර බඳවාගැනීම් උත්සන්න කරනු ලැබ ඇති ආකාරයත් එම වාර්තාවේ සවිස්තරව සඳහන්වේ.

වන්නි පලාතේ සිදුකරන මෙහෙයුම් නතරකොට තම සේවකයන් එම පලාතෙන් ඉවත්කරගන්නාමෙන් සියලුම එක්සත් ජාතීන්ගේ සහ මානුෂික ආධාර ආයතනවලට පසුගිය සැප්තැම්බරයේදී ආණ්ඩුව නියෝගකල අතර, එහි රැඳීසිටීමට අවසර ලැබුනේ ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයට සහ වන්නි ප්‍රදේශවාසීන් සේවය කරන කැරිටාස් සංවිධානයට පමණි. පලාතේ මානුෂික ආධාර සම්පාදනය බරපතල අන්දමින් බිඳවැටී ඇතිබව හියුමන් රයිට්ස් වොච් සංවිධානයේ පර්යේෂණයෙන් විස්තර කෙරේ : යුද්ධයට කොටුවී සිටින සාමාන්‍ය ජනතාව සඳහා ලබාදෙන ආහාර බෙදාහැරීම් අවශ්‍ය අවම ප්‍රමාණයෙන් සියයට 40ක් තරම් පහල මට්ටමක පවතින බවද, දස දහස් ගණන් ජනතාවට ප්ලාස්ටික් කූඩාරම් වහාම අවශ්‍යව තිබෙන බව සහ ඒ' ජනතාව වෙනුවෙන් සනීපාරක්ෂක පහසුකම් ඇත්තේම නැති තරම් බවද පර්යේෂණයෙන් හෙලිදරව්වී තිබේ. නොවැම්බර් මාසයේදී නිශා කුණාටුව විසින් 60,000ත් 70,000ත් ආසන්න උන්හිටිතැන් අහිමිවූ ජනකායකගේ කූඩාරම් විනාශකෙරුණු නමුත් කූඩාරම් තැනීම සඳහා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය රැගෙන යාම සඳහා ආධාර ආයතනවලට අවසර දීම ආණ්ඩුව ප්‍රතික්ෂේප කලේය.

(http://www.hrw.org/en/news/2008/11/29/sri-lanka-allow-aid-groups-help-cyclone-victims).

වන්නි පලාතෙන් පලා එන සියලුම දෙමළ සාමාන්‍ය වැසියන් සහ ඉන්දියාවේ සිට බෝට්ටුවලින් යලි සියරට පැමිණෙන දෙමළ අනාථයන් රටේ ආරක්ෂාවට තර්ජනයක්ය යන පදනම මත 2008 මාර්තු මාසයේ සිට රඳවා තබාගෙන සිටී. මන්නාරම සහ වවුනියා දිස්ත්‍රික්කවල පිහිටි "සුභසාධක කඳවුරුවල" දහසකට ආසන්න සාමාන්‍ය වැසියන් පිරිසක් හමුදා ආරක්ෂාව යටතේ  දින නියමයකින් තොරව රඳවා තබාගෙන සිටී. ආණ්ඩුවේ මෙම ප්‍රතිපත්තිය උන්හිටිතැන් අහිමිවුවන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමකි. ප්‍රමාණවත් ආවරණයක් හෝ සනීපාරක්ෂක පහසුකම් නොමැති මෙම කඳවුරුවල පවතින්නේ ඉතාම සීමිත පහසුකම් වන අතර, ඔවුන්ට මානුෂික ආධාරද ලැබෙන්නේ සීමිත වශයෙනි.

"වන්නි පලාතෙන් පලා එන සාමාන්‍ය වැසියන් සඳහා පිහිටුවා ඇති ආණ්ඩුවේ 'සුභසාධක කඳවුරු' යථාර්ථය වසන් කරනලද සිරකඳවුරු" බව ඇඩම්ස් පවසයි. "මෙහි තිබෙන කණගාටුදායක තත්ත්වය නම් ආණ්ඩුව විසින් මෙසේ රඳවාගෙන සිටින මේ ජනතාවගෙන් බහුතරය එල්ටීටීයේ අතවරවලින් බේරීම සඳහා පලා ආ පිරිස් වීමයි. මේ රඳවාගැනීමේ ප්‍රතිපත්තිය ආණ්ඩුව විසින් උපකාර කළයුතු ජනතාව පීඩාවට පත්කරන්නකි".

ආධාර ආයතනවලට පිටව යනමෙන්  නියෝග කිරීමෙන් අනතුරුව එම විශාල හිඩැස පිරවීම සඳහා ආණ්ඩුව දරන උත්සාහය සාර්ථක වී නොමැති බව හියුමන් රයිට්ස් වොච් සංවිධානයේ පර්යේෂණය මගින් අනාවරණය විය. වන්නි පලාතේ ආණ්ඩුව විසින් පත්කරන ලද නිළධාරීන් ලබාදුන් තොරතුරු ඇතුලු දැනට ලැබී තිබෙන තොරතුරු අනුව අණාවණය වන්නේ එහි වෙසෙන සාමාන්‍ය ජනතාව ආහාර, ආවරණ උපකරණ, ජලය, සනීපාරක්ෂක සැපයුම් සහ දෛනික ජීවිතයට අත්‍යවශ්‍ය අනෙක් පහසුකම්වල බරපතල හිඟයකට මුහුණපා සිටින බවයි.

"මානුෂික අවශ්‍යතා හිඟකම සම්බන්ධයෙන් ආණ්ඩුවේම නිළධාරීන් පවා නිරන්තරයෙන් අනතුරු අඟවමින් සිටින වාතාවරණයක ආණ්ඩුව ඉදිරිපත් කරන හිස් ප්‍රලාප භූමියේ පවතින තත්ත්වය සමඟ නොසැසඳෙන," බව ඇඩම්ස් පවසයි.